# 07 ශ්‍රේණිය - සිංහල

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පොත අංක-01

## (2020- නව නිර්දේශය)




සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


(විවිධ පළාත් සහ පාසල් මගින් පළමුවන වාරය සඳහා නිකුත් කළ ප්‍රශ්න පත්‍ර 04ක් සහ ලැබී ඇති පිළිතුරු පත්‍ර අන්තර්ගතය.)

සියලුම හිමිකම් ඇවිරිණි

විශාඛා විද්‍යාලය, කොළඹ 05

පළමු වාර පරීක්ෂණය - 2016

සිංහල භාෂාව හා සාහිත්‍යය

7 ශ්‍රේණිය

කාලය : පැය 2 යි

නම / අංකය : ......................................................................................................

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

❖ නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(1) • ඉශ්ටාර්ථය • ඉෂ්ටාර්ථය • ඉෂ්ඨාර්ථය • ඉෂ්ඨාර්තය

(2) • ආකර්ෂණය • ආකර්ශනය • ආකර්ශණය • ආකර්ෂනය

(3) • ආබාශය • ආභාෂය • ආභාසය • ආබාසය

❖ නිවැරදි උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය යොදා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.

(4) ........................................ (ගායිකාවක / ගායිකාවක්) වේදිකාවට .................................. (පිවිසුණාය / පිවිසුණේය)

(5) ...................................... (තුරුගොමු / තුරුගොමුව) මලින් බර .................... (වෙති/ වූහ)

(6) ...................................... (වෛද්‍යවරයකු / වෛද්‍යවරු) රෝගීන් පරීක්ෂා .............................. (කළහ / කළේය.)

(7) ...................................... (ගුරුතුමිය / ගුරුවරියක) ශිෂ්‍යාවන් හරිමග ................................ (යැවූවාය/ යැවූවෝය)

❖ පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පද කුමන ක්‍රියා වර්ගයට අයත් දැයි ඉදිරියේ ඇති හිස්තැනෙහි ලියන්න.

(8) උපාසිකාව පන්සිල් සමාදන්වී ධර්ම දේශනාව ශ්‍රවණය කළාය. ................................

(9) ක්‍රීඩකයා දියෙහි පිහිනමින් ඉදිරියට ඇදුණේය. ...............

❖ ඉදිරියෙන් දී ඇති පදයට සමානාර්ථයක් සහිත පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(10) (i) උත්සහය - ක්‍රියාශීලී , උපද්‍රව , ප්‍රයත්නය

(ii) වනය - අසපුව , අරණ , සිලිල

❖ ඉදිරියෙන් දී ඇති පදයට විරුද්ධාර්ථයක් සහිත පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(11) (i) දෙරණ - මිහිකත , ගගන , සිඳු

(ii) දරිද්‍ර - උවදුර , දුගී , ධනවත්

❖ මෙම වැකි සුදුසු පද යොදා සම්පූර්ණ කරන්න.

(12) (අද / අඳ) ........................ මිනිසාගේ මරණය ........... ... . (අද / අඳ) දින සිදුවිණි

❖ ඉරි ඇඳි පදය කුමන පුරුෂයට අයත්දැයි වරහනින් තෝරන්න.

(14) සමන් සතුටින් නිවසට පිවිසුණි. (මධ්‍යම පුරුෂ / ප්‍රථම පුරුෂ / උත්තම පුරුෂ)

(15) අපි නගරාසන්න පෙදෙසක දිවි ගෙවන්නෙමු. (මධ්‍යම පුරුෂ / ප්‍රථම පුරුෂ / උත්තම පුරුෂ)

❖ පහත සඳහන් වැකියෙහි ඉරි ඇඳි පදයෙහි අදහස තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(16) තමාට වැල්වටාරම් ඇසීමට උවමනා නැති බව සිරිසේන පැවසුවේය.

- ඕපාදූප
- අනවශ්‍ය විස්තර
- කේලාම්
- මුසාවාද

(17) නිමල්ගේ යෝජනාව තරිඳු එක පයින්ම ස්ථිර කළේය.

- ප්‍රසාදයෙන්
- තනිකකුලෙන් සිටිමින්
- අසතුටින්
- ඉතා කැමැත්තෙන්

❖ පහත දැක්වෙන ඉරි ඇඳි ප්‍රාදේශීය ව්‍යවහාර පද සඳහා පොදු ව්‍යවහාරයේ යෙදෙන වචනය අදාළ අංකය සහිත හිස්තැනෙහි ලියන්න.

(18) සිරිදාසත් දාවිත් මාමාත් (i) රසබෝය හා (ii) කළු ගුගුල තොල ගාමින් සිටියහ.

(i) ..............................................................

(ii) ..............................................................

(19) මැණිකේ (i) හීල් අඩක්කුවට (ii) කිරි කබළු ටිකක් සූදානම් කරන්නයි රාලහාමි පැවසුවේය.

(i) ..............................................................

(ii) ..............................................................

(20) මෙම පදවල අනුක්ත පද ලියා දක්වන්න.

(i) කුරුල්ලෝ - ..............................................................

(ii) සහෝදරියක් - ..............................................................

(ලකුණු 2×20=40)

## II කොටස

❖ පළමු සහ දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

(1) පන්ති කාමර ඇගයීම් ප්‍රභේදයක් ලෙස ඔබ ඉදිරිපත් කළ සංවාදය ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. ඔබ කණ්ඩායම ඉදිරිපත් කළ සංවාදයේ අරමුණු වූයේ කුමක්ද?
2. සංවාදය ඉදිරිපත් කිරීමේදී ඔබට මුහුණ දීමට සිදු වූ ගැටලු දෙකක් ලියන්න.
3. ඔබ එය නිරාකරණය කර ගැනීමට යෙදූ පිළියම කුමක්ද?
4. සංවාදයක යෙදීමේදී අපි සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.
5. මෙම ක්‍රියාකාරකම තුළින් ඔබට ලැබුණු අත්දැකීම් දෙකක් ලියා දක්වන්න.

6. මෙම ඇගයීම තුළින් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියා දක්වන්න.
7. මෙම ක්‍රියාකාරකමේ යෙදුනු අනෙකුත් කණ්ඩායම්වල ඔබ හඳුනාගත් දුබලතා දෙකක් ලියා දක්වන්න.
8. වෙනත් කණ්ඩායම්වල ඔබ හඳුනාගත් ප්‍රබලතා දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 2× 8=16)

(2) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.

1) ගැමි සුවඳින් ඔපවත් වූ ජන සාහිත්‍යය
2) මා කැමතිම ආගමික නායකතුමා
3) උපභාෂා විශේෂ පිළිබඳ අවබෝධයේ වැදගත්කම
4) හිරු බැසයන සැන්දෑවක වෙරළක අසිරිය.

(ලකුණු 14)

(3) පහත සඳහන් කවිය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පොඩි දුව පොඩි පුතා ඔබ ඉපදුණු දිනය
ඔබ මවුපියන්හට සැනසුම් ගෙන දුනිය
සැමවිට සැම දෙනට පෙන්වා මුදු ගතිය
හොඳ හැටි වැඩුම දරුවනි ඔබ හැම සතුය

රෝස අරලිය නොයෙක මල්දම් නෙළුම් මානෙල් නිල් දියේ
දිලෙන මුතු කැට මැණික් මිනිරන් දෙරණ යට බෙහෙවින් තියේ
ලොවේ පරසිඳු රන් බිමයි මේ ඇතිව සෙනෙහස ඔබ ළයේ
පිරුණු හදකින් පෙරට යනු ඔබෙ නමට නිති තුති ගී ගැයේ

1) කවියේ සඳහන් පරිදි ඔබේ මව්පියන්ට සැනසුම උදාවූයේ කෙදින ද?
2) සෑම දරුවකුම සතු විය යුතු දෙයක් ලෙස කවියා දකින්නේ කුමක්ද?
3) මෙහි සඳහන් පරිදි මිහිතලයේ නිදන්ගතව ඇති දෑ මොනවාද?
4) ''ලොවේ පරසිඳු රන් බිමයි මේ'' යනුවෙන් කවියා පවසන්නේ කුමන දේශයක් පිළිබඳව විය හැකිද?
5) පහත සඳහන් පදවලට සමාන පදය බැගින් කවියෙන් උපුටා ලියන්න.
   (i) ප්‍රසිද්ධ ....................................  (ii) මොළොක් -....................................

(ලකුණු 2×5=10)

(4) මිශ්‍ර සිංහල අක්ෂර මාලාව ඇසුරින් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(i) ඔබ උගත් වර්තමාන සිංහල හෝඩියේ අක්ෂර ගණන කීයද?
(ii) එහි ඇතුළත් ස්වර අක්ෂර අනුපිළිවෙළින් ලියා දක්වන්න.
(iii) සිංහල අක්ෂර මාලාවේ ඇති සංඥක අක්ෂර ඇතුළත් වචන 5 ක් ලියා දක්වන්න.
(iv) අක්ෂර මාලාවේ ව්‍යඤ්ජන අක්ෂරවලට අයත් මහප්‍රාණ අක්ෂර 05 ක් ලියා එම අක්ෂර ඇතුළත් වචන 05 ක් ලියන්න.

(v) මෙම අක්ෂර දෙක හඳුන්වා ඒවා යෙදුන වචනය බැගින් ලියා දක්වන්න.

ශ - ...............................................

ෂ - ............................................... (ලකුණු 2×5=10)

(5) පහත සඳහන් පාඨවල අවස්ථා සම්බන්ධය ලියා දක්වන්න.

(1) ''ඇයි ඉතින් ගැලවෙ විදියක් ඔබම කල්පනා නොකරන්නේ''

1) මෙම ප්‍රකාශය උපුටාගත් පාඩම කුමක්ද?

2) පාඩම උපුටාගත් කතාව අයත් වන්නේ කුමන රටකටද?

3) මෙහි ගැලවෙන්න විදිහක් / කල්පනා කරන්නේ කුමන ගැටළුවක් විසඳා ගැනීමටද?

4) මේ ප්‍රකාශය සිදුකරන්නේ කවුද? (ලකුණු 1×4=4)

(2) ''ආ... ඒ අඳින්නේ කමත් යන්තරේ''

1) මෙසේ කීවේ කවුද?

2) කාටද?

3) කුමන අවස්ථාවකදී ද?

4) කමත් යන්තරේට භාවිතා කරනවා යැයි ප්‍රකාශිත වූ අනෙක් නාමය කුමක්ද?

(ලකුණු 1×4=4)

3) ''ගලක් පළා ගලක් දුටිමි
එගල පළා රිදී දුටිමි''

1) මෙය උපුටාගත් පාඩම කුමක්ද?

2) මෙහි ''එගල පළා රිදී දුටිමි'' යනු පදයෙහි අදහස කුමක්ද? (ලකුණු 1×2=02)

(6) මෙම ප්‍රස්තාවපිරුළුවල අදහස ලියා දක්වන්න.

(i) හිල්කුඩෙන් වතුර අදින්නා වාගේ

...............................................................................

(ii) බැදගත් බෙරය ගැසිය යුතුය

...............................................................................

(iii) බල්ලාට කිදේ බලු නකුටට කීවා වගේ

...............................................................................

(iv) කබලෙන් ලිපට වැටුණා වගේ

...............................................................................

(v) ඌරෝ කැකුණ තළන විට හබන් කුකුළන්ට රජ මඟුල්ලු

............................................................................... (ලකුණු 2×5=10)

(7) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තිරිසන් සතුන්ගෙන් තොර ලොවක මිනිසුන්ට ජීවත් විය හැක්කේද? සියලු තිරිසන් සතුන් විනාශ වී ගියහොත් ජීවිතයේ දැඩි හුදකලා බවින් මිනිසාද විනාශ වී යනු ඇත. ඒ තිරිසනුන්ට සිදුවන කුමක් වුවත් මිනිසාට ද ඉක්මනින්ම සිදුවන නිසාය. ලෝකයේ පවත්නා සියලු දේ අතර ඇත්තේ එකිවෙකට බැඳුණු ඥාතීත්වයකි. ඔබගේ දරුවන් දෙපයින් නැගී සිටින්නේ අපගේ මුතුන් මිත්තන්ගේ භස්මාවශේෂයෙන් පෝෂණය වූ භූමියක බව ඔවුන්ට පහදා දෙනු මැනවි. භූමිය අපගේ මාතාවයි. මව්බිමට සිදුවන ඕනෑම හොඳක් හෝ නරකක් එහි ජීවත් වන දරුවන්ටත් උරුම වන්නේය. අප දන්නා පරිදි මේ මහ පොළව මිනිසාට අයිති නැත. එහෙත් මිනිසා මහ පොළවට අයත්ය. පවුලේ සියලුදෙනා එකම ලේ බැම්මකින් බැඳෙන්නාක් මෙන් මෙලොව ඇති සියලු දෙයම එකට බැඳී තිබෙන බව අපි දනිමු. ජීවිතය නැමති දැල මිනිසා විසින් වියන ලද්දක් නොවේ. ඔහු එහි නූල්පටක් පමණි. මිනිසා එම දැලට යම් හානියක් කරතොත් ඒ තමාටම කරගන්නා උපද්‍රවයකි.

\- සියැටල් ප්‍රකාශයෙනි-

1) සියලු තිරිසන් සතුන් විනාශ වී ගියහොත් මිනිසාද විනාශ වී යතැයි ප්‍රකාශකයා පවසන්නේ ඇයි?
2) මෙහි සඳහන් පරිදි ප්‍රකාශකයා දරුවන්ට පහදා දෙන්න යැයි කියන්නේ කුමක්ද?
3) මහපොළව පිළිබඳ ප්‍රකාශකයා සතු ගෞරවය එළි දැක්වෙන වැකිය ඡේදයෙන් උපුටා ලියන්න.
4) මිහිතලය මත ඇති සියළු දේ එකිනෙකට සම්බන්ධ දේවල් බව හැඟවෙන්නේ ඡේදයේ ඇති කුමන වැකියෙන්දෙ?
5) ඡේදයෙහි ඇති
උපමාව -..........................
උපමේය - ........................ වෙන් කර ලියන්න.

(ලකුණු 2×5=10)

Set A
1

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **07 ශ්‍රේණිය**
**இரண்டாம் தவணைப் பரீட்சை 2018** **தரம் 07**
**First Term Test 2017** **Grade0 7**

**සිංහල භාෂාව හා සාහිත්‍යය 1**
**Sinhala Language And Literature 1**

**පැය දෙකයි**
*Two Hour*

1කොටස

*සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පහත වැකිවල ඇති රුඞී වලට යටින් ඉරක් අඳින්න.

01. තමන් ඒ සොරකම පිළිබඳ **<u>අඳෝ සංසාරයක්</u>** නොදන්නා බව පියසිරි කීවේය.

02. හේරත් හාමි **<u>කුකුළා අතින් අරගෙන</u>** හේනට ගිය බව සියදෝරිස් පවසා සිටියේ ය.

වරහනට පිටින් දී ඇති වචනය වෙනුවට යෙදිය හැකි වචන තුනක් වරහන තුළ ඇත. නොගැළපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

03. දත්(දන්ත, චූර්ණ, දසන්, දළ)

04. මුහුද (සමුදුර, සයුර.රුවන්, සිඳු)

05. සිංහල අක්‍ෂර මාලාවේ ව්‍යඤ්ජන අක්‍ෂර ගණන,

i. 18 කි. ii. 40 කි. iii. 42කි. iv. 36 කි.

පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

06. කඩි ගුලට ......................................වගෙයි.

07. නරියට ............................ වගෙයි.

පහත සඳහනන් පදවල අනුක්ත පද ලියන්න.

i. තොපි ii. තෝ

ප්‍රථම පුරුෂයට අයත් නාම පද දෙකක් කොටුව තුළින් තෝරා ලියන්න.

| |
|---|
| මම, අප, අම්බරුවා |
| නුඹ, තෝ, ළමයි |
| මා, තොපි |

09. ........................................................................

10. ........................................................................

11. සිංහල අක්ෂර මාලාවේ සඤ්ඤක අක්ෂර යෙදුණු වචන දෙකක් ලියන්න.

i. ..............................................  ii. .......................................................

නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

12. විශිෂ්ය, විශිස්ට, විශිෂ්ට

13.කනිෂ්ට, කණිෂ්ය, කනිෂ්ය

කමත් භාෂාව ඇසුරින් පහත සඳහන් පදවල ව්‍යවහාර භාෂාව ලියන්න.

14. රසබෝය ........................................................

15. රතු ගඟුල .........................................................

16. පහත වගුවෙහි සඳහන් හිස්තැන් වලට සුදුසු පද යොදා වගුව සම්පූර්ණ කරන්න.

| ඒක වචන | බහු වචන |
|---|---|
| උදැල්ල | i. ................................ |
| ii. .................................. | කොක්කු |
| iii. ................................ | දොරවල් |
| දරුවා | iv................................. |

පහත ඉරි ඇඳිපද කවර වර්ගයට අයත්දැයි දී ඇති පිළිතුරු අතරින් තෝරා ඉරක් අඳින්න.

17. දැරිය නිවසට පැමිණ දිවා ආහාරය ගන්නී ය.

i. පූර්ව ක්‍රියා  ii. මිශ්‍ර ක්‍රියා  iii. විධි ක්‍රියා  iv. ආශීර්වාද ක්‍රියා

18. දරුවා හඬමින් මව සොයා යයි.

i. පූර්ව ක්‍රියා ii. මිශ්‍ර ක්‍රියා iii. ප්‍රයෝජ්‍ය ක්‍රියා iv. ආශීර්වාද ක්‍රියා

සුදුසු ක්‍රියා පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

19. මිනිස්සු කැලෑ එළි (කරයි. / කරති.)

20. ගුරුතුමිය දරුවන්ට ඔවදන් (දුන්නා හ. /දුන්නා ය.)

(ලකුණු 2x20=40)

ii කොටස

පළමු වන ප්‍රශ්නය, දෙවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

01. සිංහල විෂය සඳහා ඔබ නිර්මාණය කළ පොත් පිංචක් ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. පොත් පිංචක් සකස් කළේ කුමන මාතෘකාවක් ගැනද? (ලකුණු 02)

ii. ඔබ ඒ සඳහා යොදාගත් සම්පත් මොනවා ද? (ලකුණු 02)

iii. ඔබ ඒ සඳහා උපදෙස් ලබාගත් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

iv. මෙම ක්‍රියාකාරකම සිදු කිරීමේදී ඔබ මුහුණ දුන් ගැටළු 04 ක් ලියන්න. (ලකුණු 04)

v. පොත් පිංච නිර්මාණය කිරීමේදී ඔබ ලබාගත් ප්‍රයෝජන 02 ක් ලියන්න. (ලකුණු 04)

(ලකුණු 15)

02. පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.

i. සුමිතුරු පරිසරය සුරකිමු නිරතුරු

ii. මා පසල් ගිය පළමු දිනය

iii. මා සමනලයෙකු නම්

iv. මගෙ මව් බිම මට අගේ ය.

v. අති පූජ්‍ය වැලිවිට සරණංකර සඟරජ හිමිපාණන්

(ලකුණු 15)

03.පහත සඳහන් ප්‍රකාශය ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

"පුතේ අම්මාගෙන් <u>යතුර</u> ඉල්ලා ගෙන එන්න"

i. මෙම ප්‍රකාශය කළේ කවුද?

ii. මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

iii. මෙම පාඩමින් විස්තර වන්නේ කුමක් ද?

iv. මෙහි ඉරි ඇඳි පදයේ අර්ථය ලියන්න.

v. මෙම ප්‍රකාශයේ සඳහන් විරාම ලකුණු නම් කරන්න.

(ලකුණු 10)

04. ඔබ පාසලේ පැවති වාර්ෂික විවිධ ප්‍රසංගයේ තොරතුරු සඳහන් කරමින් වෙනත් පාසලකට ගිය ඔබේ මිතුරියක/ මිතුරෙකු වෙත යැවෙන ලිපිය ලියන්න.

(ලකුණු 10)

05. වර්ෂ අවසාන දෙසැම්බර් නිවාඩුවෙන් පසු නව වසරේ පාසලට පැමිණි විට ඔබට හමුවන ඔබේ හොඳම මිතුරා / මිතුරිය සමග ඇතිවන කෙටි සංවාදයක් ලියන්න.

(ලකුණු 10)

06. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

හලාවත ප්‍රදේශයේ 1897 දෙසැම්බර් 27 දින මිහිඳු කුලසූරිය එච්.දියෝගෝ පීරිස් මහතා සහ මිහිඳු කුලසූරිය ඒ.ක්ලේරා මහත්මියට දාව එඩ්මන්ඩ් පීරිස් කුමරු උපත ලැබීය. මෙරට ඉංග්‍රීසි පාලන සමයේ උපන් එඩ්මන්ඩ් පීරිස් කුමරු ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ හලාවත ශාන්ත මරියා ඉංග්‍රීසි පාසලෙන් ය. ද්විතියික අධ්‍යාපනය ලැබුවේ කොළඹ ශාන්ත ජෝෂප් විදුහලෙන් ය. 1921 වර්ෂයේ දී පෙර පූජක පුහුණුව ලැබීම සඳහා බොරැල්ලේ පිහිටි ශාන්ත බර්නාඩ් දෙව් සත් සලට ඇතුළු විය. 1924 දී දෙව් සත් හලේ අධ්‍යාපනය හමාර කොට එහිදී ම අති උත්තම අන්තෝනි කුරේ කොළඹ අගරද ගුරුතුමාගෙන් නිර්මල මරියනිකාර් පියතුමකු ලෙස පූජත්වය ලැබ එඩ්මන්ඩ් පීරිස් පියනම වශයෙන් ප්‍රකට විය. බාල වියෙහි සිට ම පොත පතට ඇලුම් කළ මෙතුමා ඉගනීමෙහි සූරයෙක් විය. විසි හතර පැයම කාල සටහනකට අනුව වැඩ කළේ ය.

i. මෙම ඡේදයේ සඳහන් සුවිශේෂී චරිතය නම් කරන්න.

ii. එතුමන් උපන් ගම් ප්‍රදේශය කුමක් ද?

iii. එතුමන් අධ්‍යාපනය ලැබූ පාසල් නම් කරන්න.

iv. එතුමන් පූජත්වය ලබා ගන්නේ කවුරුන් අතින් ද?

v. එතුමන්ගේ චරිතයෙන් ලබා ගත හැකි ජීවිත ආදර්ශ 02 ක් ලියන්න.

(ලකුණු10)

රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
පළමු වාර පරීක්ෂණය - 2020
First Term Test - 2020

**සිංහල භාෂාව හා සාහිත්‍යය** කාලය පැය එකයි මිනිත්තු තිහයි.

නම / අංකය : .................................................................... **7 ශ්‍රේණිය**

**I කොටස**

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* නිවැරදි පිළිතුර තෝරන්න.

(01) වර්තමාන සිංහල අක්ෂර මාලාවේ භාවිතා වන ස්වර අක්ෂරයක් නොවන්නේ,
(i) අ , ඉ (ii) ඉ , ඊ
(iii) උ , ඒ (iv) ශ , ළ

(02) "ථ" සහ "ත" යන අක්ෂර පිළිවෙළින් හඳුන්වන්නේ,
(i) අල්පප්‍රාණ හා මහප්‍රාණ අක්ෂර ලෙසය.
(ii) මහප්‍රාණ හා අල්පප්‍රාණ අක්ෂර ලෙසය.
(iii) සඤ්ඤක හා මූර්ධජ අක්ෂර ලෙසය.
(iv) තාලුජ හා මහප්‍රාණ අක්ෂර ලෙසය.

(03) අක්ෂර වින්‍යාසය නිවැරදි ලෙසින් ලියැවුණු වචන පේළිය වන්නේ,
(i) පුස්ථකාලය, ආභාසය (ii) නිශ්ශබ්ද, විසේසන
(iii) ආස්වාද , විස්මය (iv) ප්‍රස්ථාර, දූස්ට

(04) පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.
(i) ඉවසීමෙන් .......................................... ලැබේ.
(ii) කියන්නා කෙසේ කීවත් .......................................... සිහි බුද්ධියෙන් ඇසිය යුතුය.

(05) පහත ඉරි ඇඳි පදයේ අදහසට සමීප අර්ථයක් ගෙන දෙන ඉඟි වැකිය වනුයේ,
"ඔහු අසල්වැසියන් සමග කිසිදු <u>සුහදතාවයක්</u> නැතැයි ඇය කිව්වාය."
(i) අමනාපයක් (ii) මිත්‍රත්වයක්
(iii) ඇයි හොඳයියක් (iv) හොඳ හිතක්

(06) පහත සඳහන් යුගළ පද දෙක සම්පූර්ණ කරන්න.
(i) අඩුම ........................................
(iii) යාන ........................................

• වරහනට පිටින් දී ඇති වචනයට විරුද්ධ පදය වන්නේ,

(07) ප්‍රවීන - ( ආධුනික / නිපුණ / දක්ෂ / ප්‍රාචීන )
(08) ස්ථිර - ( නියත / අස්ථිර / නියම / නිතර )

• පහත සඳහන් වචන වලට දී ඇති සමානාර්ථ පදය තෝරා ඉරක් අඳින්න.

(09) ශීර්ෂය - ( මුදුන / සියොළඟ / මුහුද )
(10) වියේ - ( අවසානයේ / වයසේ / තරාතිරමේ )

• පහත සඳහන් ව්‍යවහාරයන්ට කමත් භාෂාවෙන් දැක්වෙන වචනය ලියන්න.

(11) සේදැරි කරනවා - ..................................................................
(12) අඬහැරය - ..................................................................

(13) දී ඇති වචන අතුරින් උත්තම පුරුෂ ඒක වචන පදය වන්නේ,

(i) මම (ii) මාමා (iii) අපි (iv) අපි

(14) දී ඇති වචන අතුරින් ප්‍රථම පුරුෂ බහුවචන පදය වන්නේ,

(i) ළමයා (ii) ඇය (iii) ඔවුහු (iv) ගොවියෝ

(15) මධ්‍යම පුරුෂයට අයත් ඒක වචන පදයකි.

(i) ළමයි (ii) නුඹ (iii) නුඹලා (iv) කාන්තාවන්

(16) ස්ත්‍රීවාචී පද පමණක් ඇතුළත් වරය වන්නේ,

(i) කුමර, ඇතා, සෙබලිය , ඔහු

(ii) වස්සා, කාන්තාව, ඇය, නැගණිය

(iii) නිවේදිකාව, ඇතින්න, ළඳ , සෙබඩ

(iv) දුව, පුතා, යකින්න, මිනිසා

(17) පහත සඳහන් වචන වලට අනුක්ත පද ලියන්න.

(i) ළමයෙක් - ..........................................................................

(ii) සහෝදරියක් - ..........................................................................

(18) ගුරුවරු ළමයින් යහමග යවති. මේ වාක්‍යෙය් ගුරුවරු යන පදය

(i) උක්ත පදයයි. (ii) අනුක්ත පදයයි.

(iii) ගැළපෙන පදයයි. (iv) නොගැළපෙන පදයකි.

(19) දඩයක්කරුවා සතුන් දඩයම් කරති මේ වාක්‍යයේ සතුන් යන පදය,

(i) උක්ත පදයයි. (ii) ප්‍රධාන පදයයි.

(iii) අනුක්ත පදයයි. (iv) අනවශ්‍ය පදයකි.

(20) හැදෙන වැඩෙන දරුවන්ට හොඳින් හැදීමට උපදෙස් දෙන අතීතයේ ලියැවුණු ග්‍රන්ථයකි,

(i) ජාතක කතා පොත. (ii) සිංහල සාහිත්‍ය සංග්‍රහය .

(iii) බුත්සරණ. (iv) සිරිත් මල්දම

## II කොටස

* **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

I. පාසලෙන් මා ගිය අධ්‍යාපන චාරිකාව.

II. ළඟ එන සිංහල අලුත් අවුරුද්ද

III. අපේ ගමේ කුඹුරේ ගොයම් කැපුදා

(02) ජීවන ගමනේ රට 60 වන විය සමරන ඔබේ මිත්තණියට සුබ පතා සුබ පැතුම්පතක් නිර්මාණය කරන්න.

(03) පෙළ පොත ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

(i) ''ආයුබෝවන් යහළුව මේ උදෑසන කෙසේද ඔබගේ සුවදුක්?''

I. ඉහත ප්‍රකාශය කරන්නේ කවුද?

II. එය උපුටාගත් පෙළ පොතේ සඳහන් පාඩම කුමක්ද?

III. එම පාඩම ඇතුළත් ප්‍රකට ජනකතා පොත නම් කරන්න.

(ii) ''අයියේ තේ කහට වලට නේද 'රතු ගඟුල' කියන්නේ?''

I. මෙහි සඳහන් අයියාගේ නම කුමක්ද?

II. එම ප්‍රකාශය ඇතුළත් පෙළ පොතේ සඳහන් පාඩම නම් කරන්න.

III. පහත සඳහන් වචන වල සාමාන්‍ය ව්‍යවහාරය නම් කරන්න.

1. හීල් අඩුක්කුව
2. මුත්තෙට්ටුව

(04) ''කියවන්නෝ දිනන්නෝ'' වැඩසටහන යටතේ ඔබට කියවීමට ලබා දී ඇති පොත් ඇසුරෙන් පිළිතුරු ලියන්න.

- **ඔබ විසින් පිළිතුරු ලිවිය යුත්තේ ප්‍රශ්න දෙකකට පමණි.**

1)

I. "කොස් ඇට බට්ටා" නම් ළමා ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.

II. ''ඔයාට ගණන් වගයක් හදන්න තියෙනවා කිව්වා නේද?''
එම ග්‍රන්ථයේ ඇතුළත් ඉහත ප්‍රකාශය කරන්නේ කවුරුන් විසින් කාහටද?

2)

I. ''කැරවැන් ගෙදර ළමයි'' කාගේ කෘතියක්ද?

II. එහි ඇතුළත් චරිත තුනක් නම් කරන්න.

3)

I. ''බාලයා හා කුළු හරක්'' යන ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.

II. මේ අටුවේ ඇති දුංතෙල් බෝතලේ පොඩ්ඩකට ඒක මට ගෙනැත් දියල්ලකො.
මේ කාගේ ප්‍රකාශයක්ද?

4)

I. ''Simple stories for beginners'' හි කතුවරයා නම් කරන්න.

II. මේ කතාවේදී හමුවන චරිත මොනවාද?

5) .

I. ''Stories from green myths'' ග්‍රන්ථයෙහි කතුවරයා නම් කරන්න.

II. මේ ග්‍රන්ථය මුද්‍රණය කර ඇත්තේ කිනම් රටකද?

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / *All Rights reserved*

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Provincial Education - NWP**

**7 ශ්‍රේණිය** | **පළමු වාර පරීක්ෂණය - 2019** | **21 S**

නම .............................................

**සිංහල භාෂාව හා සාහිත්‍යය I -කොටස** | **කාලය පැය 02 යි**

**උපදෙස් :**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1 - කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

- **අංක 01, හා 02 ප්‍රශ්න වල ඉරි ඇඳි කොටස වෙනුවට යෙදිය හැකි වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) පන්තියට අලුතෙන් පැමිණි ඔහු මගේ <u>හොඳම මිතුරෙකි</u>

(I) අසල්වැසියෙ කි (II) අඹ යාළුවෙ කි .
(III) ගම්පලයි රයිගමයි වගේ (IV) ජාඩියට මූඩිය වගේ.

(2) නායකයෙකු හැම විටම <u>වැනෙන තීරණ</u> නොගත යුතුය.

(I) දෙබිඩි පිළිවෙතක් (II) උඩින් පල්ලෙන් සොයා බලා
(III) නොසැලකිල්ලෙන් (IV) මඬේ සිට වූ ඉන්න වගේ

- **අංක 03 - 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(3) වර්තමාන ලේඛන ව්‍යවහාරයේ දක්නට නොලැබෙන සඤ්ඤක අකුර කුමක්ද ?

(I) ඟ (II) ඦ (III) ඹ (IV) ඬ

(4) අපේ පැරණිම ව්‍යාකරණ ග්‍රන්ථය වන්නේ,

(I) සද්ධර්මරත්නාවලිය (II) ලෝකෝපකාරය (III) සිදත් සඟරාව (IV) ලේඛන රීතිය

(5) අල්ප ප්‍රාණ අක්ෂර පමණක් අඩංගු පිළිතුර තෝරන්න .

(I) ච, බ, ජ (II) ක, ට, ප (III) ද, ඨ, ඛ (IV) හ, ස, ට

- **නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(6) (I) පරිනාමය (II) සණ්ටාරය (III) පළතුරු (IV) සියළු

(7) (I) වෙළඳපොළ (II) කණ්නාඩි (III) මර්ධනය (IV) ප්‍රශ්ණ

- **හිස්තැනට සුදුසු වචනය තෝරා වාක්‍යය සම්පූර්ණ කරන්න.**

(8) සඳකඩ ................................ (පහන/පහණ) සිංහලයාගේ විශිෂ්ට කලා නිර්මාණයකි.

(9) වහා ගිනිගන්නා .............................(සුළුය/සුලුය)

(10) පාසල් වත්තේ අලුතින් (නල/නළ) ........................... ළිඳක් සෑදුවේ ය.

● දී ඇති අනුක්ත පදවල උක්ත පදය ලියන්න.

(11) ඔවුන් -

(12) ගුරුවරුන් -

(13) දී ඇති සාමාන්‍ය ව්‍යවහාරයේ ඇති පද වලට කමත් භාෂාවේ යොදන පද ලියන්න

(I) කළය - (II) කමතේ ආහාරය -

● අංක 14 සිට 15 දක්වා ප්‍රශ්න වල හිස්තැනට ගැළපෙන ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(14) නුඹ විභාගයට හොඳින් සූදානම් ......................... (වූවෙහු ද/විය/වූවෙහි ද )

(15) වෘක්ෂ ලතා වර්ෂාවෙන් නව පණ ......................... (ගත්හ/ගන්නේය/ගනිති)

● විරුද්ධාර්ථ පද ලියා දක්වන්න.

(16) (I) යහ ගුණ - (II) ඈත -

● මුලින් දී ඇති පදයට සමාන නොවන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(17) සාගරය - ( සයුර, මුහුද, සිසි, සිඳු )

(18) සඳ - ( චන්ද්‍රයා , තරුපති, දිනකර, සොමි)

● 19 හා 20 ප්‍රශ්න වල ඉරි ඇඳි පද කවර <u>ක්‍රියා පද වර්ගයට</u> අයත් ද යන්න තෝරා යටින් ඉරක් අඳින්න

(19) තාත්තා රූපවාහිනිය <u>බලමින්</u> බත් කෑවේය.

(I) පූර්ව ක්‍රියා (II) අවසාන ක්‍රියා

(III) මිශ්‍ර ක්‍රියා (IV) ආශිර්වාද ක්‍රියා

(20) ළමයි වතුරට <u>පැන</u> සෙල්ලම් කළහ.

(I) මිශ්‍ර ක්‍රියා (II) පූර්ව ක්‍රියා

(III) විධි ක්‍රියා (IV) අවසාන ක්‍රියා

(ලකුණු 2 x 20 - 40)

## II කොටස

● 01, 02 හා 03 ප්‍රශ්න ඇතුළත්ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01 පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරක් සපයන්න

(1) වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් විසින් ලියන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක නම් ලියන්න

(2) කමතේ දී "පැගිරි බෝය පිරීම" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(3) මධ්‍යම පුරුෂ බහු වචන නාම පද 02 ක් ලියා දක්වන්න

(4) ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනතාව සමාන කම් දක්වන ඉන්දියානු ගෝත්‍රය කුමක් ද?

(5) කවියේ ඉතිරි පද ලියා දක්වන්න.

මේ කොතනින් ගෙනා  ගොනා
දෙවින්දරින් ගෙනා  ගොනා
..........................................................
..........................................................

( ලකුණු 2 X 5 - 10 )

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 ට නො අඩු රචනයක් ලියන්න.

(I) ගස්වැල් සුරකිමු
(II) පොදු දේපල රැක ගනිමු.
(III) ක්‍රීඩාව තුළින් නීරෝගී ජීවිතයක් උදාකර ගනිමු.
(IV) සඳ එළියෙන් නැහැවුණ රැයක්.

(ලකුණු 20 )

(3) ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතන්න.

ගමේ සැම නැන තම දමා යන කැලි කසල නිසා පරිසරය අපවිත්‍ර වීම හා ඩෙංගු රෝගය පැතිරීමේ අවදානමක් ඇත. මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂණ මහතා වෙත යැවීමට සුදුසු රාජකාරී ලිපිය සකසන්න.

(ලකුණු 15 )

(4) පහත දැක්වෙන වාක්‍යය නිවැරදි කිරීමට අවශ්‍ය පදය වරහන් තුළින් තෝරා හිස්තැනින් ලියන්න.

(1) ගුරුතුමිය පාඩම රසවත්ව කියා...................................... (දුන්නේය / දුන්නාය )

(2) ඇළ , දොළ, ගංගා මුහුද කරා ගලා ................................ (බසියි , බසිති )

(3) ( නුඹලා / නුඹ ) ...................................... විභාගයට සුදානම් වූවෙහි ද?

(4) දඩයක්කරුවෙක් අහිංසක (මුවෙක් / මුවෙකු ) ................................ මරා දැම්මේය
.
(5) ( ඔවුහු / ඔවුන් ) .......................................... ශ්‍රමදානයෙන් පාර සෑදූවෝ ය.

(05) පහත උද්ධෘත ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

(I) "ස්වාමිනී , ආපසු ගොස් මේ ගැන තව ටිකක් සොයා බැලීම හොඳ නොවේ දෑ"

(II) "අයියේ , මොනවද කිරි කබළු කියන්නේ"

(III) "ඔව්, ගිහින් වරෙන්, නැත්තං කුමාරිහාමිලා තරහා වෙයs" .

(IV) "මොන දිවිල්ලක් ද? කෑ නො ගහා ඉන්නවා . මා කියන දේ ඇහෙන්නේ නෑ" .

(V) "නෑ නෑ ඒවා අයිති දුම්රිය ස්ථානයට".

| | පාඩමේ නම | කීවේ කවුද ? | කාහට කීවේද ? | කුමන අවස්ථාවකදී ද? |
|---|---|---|---|---|
| (I) | | | | |
| (II) | | | | |
| (III) | | | | |
| (IV) | | | | |
| (V) | | | | |

(ලකුණු 2 **X** 5 - 10 )

- දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න .

අභිනුර්ධිත ජනයෝ ස්වභාව ධර්මය දේවත්වයෙන් සලකා වැඳුම්, පිදුම් කරති, එහෙත් ඇතැම් අභිනුර්ධිතයන් පවසන්නේ තමන් බෞද්ධයන් බවයි. එහෙත් ඔවුන් බෞද්ධ වත් පිළිවෙත් අනුගමනය කරන බවත් නොපෙනේ. පන්සල, පල්ලිය, කෝවිල, වෙනසක් නොමැතිව සෑම සිද්ධස්ථානයට ම වැඳුම්, පිදුම් සඳහා යන බව පෙනෙ. අභිනුර්ධිත ජනයෝ හින්දු මෙන් සිකුරාදා දිනය ශුද්ධ දිනයක් ලෙස සලකයි, එසේම විශ්ණු, කතරගම වැනි දෙවි වරුන් අදහති.

(1) අභිනුර්ධිත ජනයා පවසන පරිදි ඔවුන්ගේ ආගම කුමක් ද?

(2) ඔවුන් වැඳුම්, පිදුම් සඳහා යන සිද්ධස්ථාන මොනවා ද?

(3) අභිනුර්ධිතයන් අදහන දෙවිවරුන් දෙදෙනාගේ නම් ලියන්න.

(4) ඔවුන්ගේ ශුද්ධ දිනය කවදා ද?

(5) දේවත්වයෙන් වැඳුම් , පිදුම් කරන්නේ කුමකට ද ?

( ලකුණු 2 **X** 5 - 10 )

පළමු වාර පරීක්ෂණය - 2019

7 ශ්‍රේණිය සිංහල භාෂාව හා සාහිත්‍යය

පිළිතුරු පත්‍රය .

1 - කොටස

(1) - (I) (11) - ඔවුහු

(2) - (IV) (12) - ගුරුවරු

(3) - (II) (13) - (I) කුඹල් ගෙඩිය (II) මුන්තෙට්ටුව

(4) - (III) (14) - වූ වෙහි ද?

(5) - (I) (15) - ගත්තේ ය.

(6) - (II) (16) - අවගුණ (II) මෑත

(7) - (I) (17) - සිසි

(8) - පහණ (18) - දිනකර

(9) - සුලුය (19) - (III)

(10) - නළ (20) - (II)

( 2 x 20 - 40 )

11 - කොටස

(01) (I) මුනි ගුණ අලංකාරය / සාරාර්ථ සංග්‍රහය / භේසජ්ජ මංජුසා සන්නය

(II) බුලත් විට කෑම

(III) තොපි / නුඹලා

(IV) කුරවර් ගෝත්‍රය

(V) ඒ මොනවට ගෙනා ගොනා
කොළ මඩනට ගෙනා ගොනා (2 x 5 - 10 )

(02) / 03 ප්‍රශ්ණවලට පිළිතුරු අනුව ගැළපෙන ලකුණක් ප්‍රදානය කරන්න

(04) (I) දුන්නාය (II) බසියි (III) නුඹ (IV) මුවෙකු (5) ඔවුහු

( 2 x 5 - 10 )

(05)

| | පාඩමේ නම | කීවේ කවුද ? | කාහට කීවේද? | අවස්ථාව |
|---|---|---|---|---|
| (I) | ගොවි බිරියක් ගේ නුවණ | ගොවියා | ව්‍යාඝ්‍රයාට | කුඹුරේ සී සාන අවස්ථාවේ දී |
| (II) | ඔයිරයිරේ ඔයි රාමා | අනුරාධ | සිරිමල්ට | කමතේ දී |
| (III) | කතා බහට සංගමයක් | අප්පච්චී | නිමල්ට | නිවසේ දී |
| (IV) | ගොවි බිරියගේ නුවණ | ගොවි බිරිය | ගොවියාට | වලිග ගැටගහගෙන එන හිවලා හා ව්‍යාඝ්‍රයා දුටු විට |
| (V) | කතා බහට සංයමයන් | ටිකට් එකතු කරන්න | ටොට්ටෝචං | දුම්රිය ස්ථානයේ දී |

(2 x 5 - 10 )

(06) (I) බෞද්ධාගම (II) පන්සල , පල්ලිය , කෝවිල (III) විෂ්ණු , කතරගම (IV) සිකුරාදා දිනය

(V) ස්වභාව ධර්මයට ( 2 x 5 - 10 )